''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 25-32

# විරෝධාකල්ප ගීවලින් නිරූපිත ගැහැනිය පිළිබඳ විමර්ශනයක්

**හංසමාලා රිටිගහපොළ**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
hansamala@sjp.ac.lk

**සංක්ෂේපය**

80 දශකයේ දී සිංහල ගීත සාහිත්‍යයෙහි දෘශ්‍යමාන වූ ප්‍රවණතාවක් ලෙස විරෝධාකල්ප අන්තර්ගත ගීත දැකිය හැකි විය. විරුද්ධත්වය, බලවත් නොකැමැත්ත වැනි අරුත් ගැබ් ව ඇති විරෝධාකල්ප සාහිත්‍යය මෙරට විද්‍යමාන වන්නේ ක්‍රි. ව. 8, 9, 10 සියවස්වල රචිත සීගිරි කුරුටු ගී සමුච්චයෙනි. මෙසේ ප්‍රාරබ්ධ විරෝධාකල්ප සාහිත්‍ය ප්‍රවණතාව නූතන සිංහල ගීත සාහිත්‍යයට ද විවිධ අවස්ථාවල දී ප්‍රවේශ විය. එය වඩාත් ප්‍රකට වන්නේ 80 දශකයේ අග භාගයේ දී ය. තව ද එවක ගීත ප්‍රචාරයේ අධිකාරී බලය හිමි කරගත් ගුවන්විදුලි සංස්ථාවෙන් එම ගී වාරණය වීම ද ඊට ප්‍රබල හේතුවක් විය. මෙසේ ගීත වාරණය කිරීමට සැබෑ හේතුව වූයේ එහි වදන් පෙළ ය. මෙම ලිපියේ අභිමතාර්ථය වන්නේ එසේ වාරණයට ලක් වූ විරෝධාකල්ප ගීවලින් ශ්‍රී ලාංකේය ගැහැනිය නිරූපණය වී ඇති ආකාරය පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් න්‍යාය ඇසුරින් විමර්ශනය කිරීම යි. ඒ සඳහා මූලිකවම යොදාගනු ලැබූවේ 1987 දී සින්ග් ලංකා ආයතනයේ නිෂ්පාදනයක් ලෙස එළිදැක්වුණු 'පවන' කැසට්පටයේ අන්තර්ගත ගීත ය. 'පවන' එවක ප්‍රචලිත එනමැති ඒකපුද්ගල සංගීත ප්‍රසංගයක දී ගැයුණු ගීත සමුච්චයකි. රාජ්‍ය මර්දනය දැඩි ව ක්‍රියාත්මක වූ බැවින් 'පවන' ප්‍රසංගය නවත්වන්නට සිදු විය. ඉහත දැක් වූ පරිදි 'පවන' ගීතාවලියට පාදක වූයේ තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජයට එරෙහි වූ නැගුණු විරෝධය යි. එකී ගී මගින් එවක පැවති පීඩනකාරී සමාජයේ ගැහැනිය අවභාවිතයට පත් වූ ආකාරය විශද වී ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ගැන සාකච්ඡා කිරීමේ දී බොහෝ විට අවධානයට පාත්‍ර වන්නේ පවුල් සංස්ථාව වුවද මෙකී ගීතාවලියෙන් අවධානය යොමු කර ඇත්තේ ඊට ඉහළින් පවතින සමාජ හා දේශපාලනික ව්‍යූහය වෙතට යි. එකී ව්‍යූහයේ බලපෑම හේතුවෙන් අප්‍රධාන තත්ත්වයට පත් ව ඇති ගැහැනියට අත්විඳින්නට සිදු වී ඇති පීඩනය යි. ඒ අනුව මෙකී විරෝධකල්ප ගීයෙන් ප්‍රතීයමාන කර ඇත්තේ අයුක්තියට, අසාධාරණයට, අවනීතියට එරෙහි ව කටයුතු කිරීම ශ්‍රී ලාංකේය ගැහැනියගේ ආස්ථානය විය යුතු බව යි.

**මුඛ්‍ය පද:** ගැහැනිය, පවන, විරෝධාකල්ප ගීත, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය

## හැඳින්වීම

80 දශකයේ දී සිංහල ගීත සාහිත්‍යයෙහි වඩාත් ප්‍රකටව දෘශ්‍යමාන වූ ප්‍රවණතාවක් ලෙස විරෝධාකල්ප අන්තර්ගත ගීත දැකිය හැකි විය. ''වි'' පූර්ව ''රුධ්'' ධාතුවෙන් (වි+රුධ්) සෑදී ඇති 'විරෝධ' යන සංස්කෘත පදයෙහි විරුද්ධත්වය, බලවත් නොකැමැත්ත, හෙළා දැකීම, වැළැක්වීම වැනි අරුත් ගැබ් ව ඇත. මෙකී විරෝධ ලක්ෂණ සාහිත්‍යයේ දී දැකිය හැකි වන්නේ ශාප, පළිගැසීම්, විලාප, අණ කිරීම්, අභියෝග කිරීම්, අවමාන, පරිභව, අපහාස, උපහාස, උද්වේගය හා තර්ජනය වැනි ආවේගවලින් සන්නද්ධව යි. (ආරියරත්න, 1999: 14) සිංහල විරෝධාකල්ප සාහිත්‍යයෙහි ආරම්භය විද්‍යමාන වන්නේ ක්‍රි. ව. 8, 9, 10 සියවස්වල රචිත සීගිරි කුරුටු ගී සමුච්චයෙනි. ඒ අතර 'බුදල්' නමින් හැඳින්වෙන කවියා ඒ ගීය රචනා කළේ සිය විරෝධය දැක්වීම නිසා ය. මෙසේ ප්‍රාරබ්ධ විරෝධාකල්ප සාහිත්‍යය සිංහල සම්භාව්‍ය සාහිත්‍යයේ ද නො අඩු ව දැකිය හැකි විය. එලෙස ම නූතන සිංහල ගීත සාහිත්‍යයට ද මෙකී විරෝධාකල්ප ප්‍රවණතාව විවිධ අවස්ථාවල දී ප්‍රවේශ වුව ද එය වඩාත් ප්‍රකට ව දෘශ්‍යමාන වන්නේ 80 දශකයේ අග භාගයේ දී ය. තව ද එවක ගීත ප්‍රචාරයේ අධිකාරී බලය හිමි කරගත් ගුවන්විදුලි සංස්ථාවෙන් එම ගී වාරණය වීම ද ඊට ප්‍රබල හේතුවක් විය. මෙසේ ගීත වාරණය කිරීමට සැබෑ හේතුව වූයේ එහි වදන් පෙළ ය. එහෙත් ගීත වාරණය සාධාරණීකරණය කිරීමේ දී මේ කටුක සත්‍යය සැඟවීමට බොහෝ විට උත්සාහ දරන ලද්දේ එය යම් ගීත/සංගීත ශෛලියක් ලෙස හඳුන්වාදෙමිනි. එනම්, එය සමාජ උවදුරක් ලෙස දක්වමිනි (තෙන්නකෝන්, 2003: 44). මෙම ලිපියේ අභිමතාර්ථය වන්නේ එසේ වාරණයට ලක් වූ විරෝධාකල්ප ගීවලින් ගැහැනිය

නිරූපණය වී ඇති ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම යි.

මෙම විමර්ශනය සඳහා මූලිකවම යොදාගන්නේ 1987 දී සින්ග් ලංකා ආයතනයේ නිෂ්පාදනයක් ලෙස එළිදැක්වුණු 'පවන' කැසට්පටයේ අන්තර්ගත ගීත ය. එම කැසට් පටයේ අන්තර්ගත වූයේ එවක ප්‍රචලිත ඒකපුද්ගල සංගීත ප්‍රසංගයක දී ගැයුණු ගීත සමුච්චයකි. ඒ බව කැසට්පට කවරයේ මෙසේ සඳහන් වේ. '1987 ජූනි මාසයේ සිට 1988 දෙසැම්බර් මාසය දක්වා 250 වරක් වේදිකාගත වූ පවන නමැති ඒකපුද්ගල ගීත ප්‍රසංගයෙහි ආ ගීත සමුච්චය යි.' ඒ ගී සරණියෙහි ඇතුළත් වූයේ එවක සමාජය පිළිබඳ විරෝධාකල්පය බව රත්න ශ්‍රී විජේසිංහගේ අදහස් මෙසේ උපුටා දක්වා ඇත. ''පවනේ ගීවල රළු නො සියුම් ගුණ, බුදුගුණාලංකාරය වැනි කාව්‍යයක පෙනෙන විරෝධාකල්ප සමඟ සසඳන්නට අපට හැකි නො වෙද? ගෝර්කිගේ ඇතැම් කෘතීන්හි දක්නා ගොරහැඩි සෘජු බව එම අවදියේ ජනතාවට හැඩතලයක් ම විය. බ්‍රෙෂ්ට්ගේ කලාවෙහි අනන්‍යතාව රැකෙන්නේ ද ස්වභාවෝක්තිය විශිෂ්ට ලෙස උපයෝගී කර ගැනීමෙන් බව මගේ අදහස යි.'' (ආරියරත්න, 1999: 46) 'පවන' ගී ප්‍රසංගයට ගී ගැයූ නන්දා මාලිනිය ඒ ගී සරණිය දැරූ අදහස මෙසේ ය. 'පවන සඳහා අපි මුල් කරගත්තේ එවකට බලයේ සිටි යූ.ඇන්.පී. (එක්සත් ජාතික පක්ෂ) පාලන තන්ත්‍රයට විරුද්ධ ව තරුණයන්ගේ තිබුණු සාමූහික විරෝධය හා පීඩනය යි. ඒ විරෝධය අපිටත් තිබුණා. ගීතය මගේ ආත්ම ප්‍රකාශනය යි. පවන මගින් මා කළේ මගේ විරෝධය මුදා හැරීම යි. එය වරදක් ද? යූ.ඇන්.පිය ගෙන ගිය භීෂණකාරී වාතාවරණය හේතුවෙන් සංයමයෙන් එයට විරෝධය දක්වන්න බැහැ. කැත්තට පොල්ල වගේ ඒකට මුහුණදෙන්න ඕන. ගීතයෙන් සමාජ දේශපාලන විපර්යාසයක් කරන්න බැහැ. ඒත් සමාජය දැනුවත් කිරීමක් කළ හැකි යි. ඒක පවනෙන් කළා. පවන අපේ ඉතිහාසයේ කොටසක්. ඒ නිසා එහි වලංගුතාව හැමදාටම පවතිනවා. සත්‍යයේ ගීතයත් ශ්‍රවණ ආරාධනා ප්‍රසංගයත් මම නැවැත්වූවේ ඒකාකාරී ප්‍රසංගයක් දිගට ම පවත්වාගෙන යා යුතු නැති නිස යි. ඒත් පවන නැවැත්වූවේ අපේ කැමැත්තට නො වෙයි. අපිට එවකට පාලනයේ සිටි එජාප ආණ්ඩුවෙන් තර්ජන තිබුණු නිස යි. (http://archives.dinamina.lk/2010/08/27/_art.asp?fn=f1008272&p=1) 'පවන' ප්‍රසංගය පැවැත්වුණේ රට පුරා භීෂණය උද්ගත වී තිබූ අවදියේ දී ය. රාජ්‍ය මර්දනය දැඩි ව ක්‍රියාත්මක වූ බැවින් 1988 දෙසැම්බර් 11, 12 සහ 13 යන තෙදින දර්ශන පවත්වා අවසන් කිරීමට ගායිකාව තීරණය කළා ය. එහෙත් ඇයට කළ හැකි වූයේ දෙසැම්බර් 11 වැනි දා සවස 3.30 දර්ශනය පමණි. එදින 6.30 දර්ශනයත් පසු දෙදිනෙහි දර්ශනත් නොපෙන්වා හදිසියේ ම 'පවන' ප්‍රසංගය නවත්වන්නට සිදු විය. (http://www.divaina.com/2010/09/03/cineart03.html) ඉහත දැක් වූ පරිදි 'පවන' ගී සමුච්චයට පාදක වන්නේ තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජයට එරෙහි වූ නැගුණු විරෝධය යි. එකී විරෝධාකල්ප ගී අතුරින් නිරූපණය වන ශ්‍රී ලාංකේය කාන්තාව පිළිබඳ ව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් න්‍යාය ඇසුරින් විමර්ශනය කිරීම මේ ලිපියේ මූලික අභිමතාර්ථය යි.

**සාකච්ඡාව**

1980 ගණන්වල දී වර්ධනය වූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender) පදනම් කරගත් විචාර ක්‍රමය ස්ත්‍රී-පුරුෂ භේදය නිසා හටගත් ප්‍රතිවිපාක ගැන සාකච්ඡා කරන්නකි. ගැහැනු-පිරිමි භේදය ස්වභාවය නොව සංස්කෘතිය විසින් ඇති කරන ලද භේදයකැයි විචාරකයෝ පැවසූහ. මෙකී න්‍යාය පිළිබඳ විචාරකයින් සැලකිලිමත් වන්නේ සංස්කෘතීන් මගින් ගැහැනු-පිරිමි සමාජභාවය පිළිබඳ භූමිකා විස්තර කිරීමට හා සීමා නිර්ණය කිරීමට සංකේත භාවිත කරන ආකාරය නිසා ය. (MacCormack and Strathern, 1980: 175- 176) ජීව විද්‍යාත්මක ව මිනිස් ශරීරයේ ඇති වෙනස සමාජීය වශයෙන් උසස් හෝ පහත් තත්ත්වයක් ඒ ඒ පාර්ශ්වයට ලැබීම හේතු වීම මගින් මෙම භේදය ඇති වේ. සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ දී ස්තරායණ මානයක් ලෙස හඳුනා ගැනෙන ස්ත්‍රී - පුරුෂ බව යනු සමාජීය වශයෙන් පිරිමි හා ගැහැනුන් අතර දක්නට ලැබෙන වෙනස නිසා ඇති වන්නකි.. නූතන ලෝකය තුළ ධනවාදයේ ව්‍යාප්තිය හේතු කොට ගෙන පංති සාධකය බඳු ස්තරායණ මාන සියලු ම රටවල්වල පාහේ දැකිය හැකි වුවද ජාතිය, කුලය සියල්ලන්ටම පොදු වන්නේ නැත. උක්ත සාධක උත්පත්තියෙන් තීරණය වන පුද්ගල ජීවිත කාලය පුරාම බල පැවැත්වෙන ඒවා ය. එසේම මෙකී සාධක ස්තරායණ මාන ලෙස වැදගත් වන්නේ ද එම විෂමතා සමාජ අසමානකම් බවට පරිවර්තනය වී ඇත්නම් පමණකි. ඒ අනුව ජාතිය සේම ස්ත්‍රී-පුරුෂ බව ද නූතන ලොවෙහි සමාජ අසමානතා බවට ඉතා ශීඝ්‍රයෙන් පරිවර්තනය වී ඇත. ස්ත්‍රී - පුරුෂ භේදය, ආවෘත ගණයේ සමාජ ක්‍රම තුළ දැකිය හැකි ස්තරායණ මානයක් වන්නේ එහි විද්‍යමාන වන අනම්‍ය ස්වරූපය හා ආරෝපිත ස්වභාවය නිසා ය. උපතට සාපේක්ෂ ව තීරණය වන බැවින් එම සාධක අනම්‍ය වූ ස්වරූපයක් දරන වෙනස් කිරීමේ හැකියාව ඉතා අවම මට්ටමක

පවතින්නකි. එනම් ස්ත්‍රී - පුරුෂ බව පුද්ගල කැමැත්තෙන් පුද්ගලයාට හිමි නො වන්නකි. මේ හේතුවෙන් සමාජයේ යම් ස්තරයක් නියෝජනය කිරීමට සිදු වීමත් සමාජ ප්‍රතිලාභ අසමාන ලෙස බෙදී යාමත් දැකිය හැකි ය. සාමාන්‍යයෙන් මෙම දෙ පිරිස අතර ඇත්තේ ශාරීරික හා ජීව විද්‍යාත්මක වෙනසකි. එම ජීව විද්‍යාත්මක වෙනස්කම මත එකී දෙපිරිසෙහි අයිතිවාසිකම් තීරණය වන බව සමාජයේ මුල් බැස ගත් අදහස යි. ස්තරායණ මානයක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වැදගත් වන්නේ, එය එක් පාර්ශ්වයක් පීඩනයට පත් කිරීමට අනෙක් පාර්ශ්වයේ ක්‍රියාකාරීත්වය හේතු වන නිසා ය. මේ අනුව සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයෙහි ගැහැනියගේ තත්ත්වයත් ඇයගේ සමාජ ආස්ථානයත් හඳුනාගැනීම අවශ්‍ය වේ. සමාජ ව්‍යුහය තුළ සමාජ න්‍යාය ලෙස හඳුන්වන්නේ සමාජ සම්බන්ධතා අතර පවත්නා පුළුල්ව පැවති රටා ය. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වටහා ගත යුත්තේ පවතින සමාජ ව්‍යුහය මත පිහිටා සිට ය. මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඇතිවන්නේ මානව ජීවිතයේ හෝ මිනිස් චරිතයේ ඇති ජීව විද්‍යාත්මක වෙනස මත පදනම් ව නො වේ. එය උත්පාද වන්නේ සමාජ සංස්කෘතික ව්‍යුහය මතිනි. ඃඤබබැකකල 1999ඵ 10* සමාජ විද්‍යාත්මක ප්‍රවේශයේ දී විමසා බලනුයේ ගැහැනිය සහ පිරිමියා අතර ඇති වෙනස්කම් සමාජීය වශයෙන් ගොඩ නගා ඇති ආකාරය ගැන යි. එනම්, එකී වෙනස්කම් අනුව හැඩ ගැසීම සමාජ වටපිටාව මගින් සිදු කෙරෙනුයේ කෙසේද යන්න ගැන යි. (Holmes, 2007: 18) සැමවිටම සරලව හා පැහැදිලිව ගැහැනු සහ පිරිමි ශරීර මත පමණක් ලඝු වෙමින් ස්ත්‍රී-පුරුෂ බව සාකච්ඡා කළ නොහැකි බව සමාජ විද්‍යාඥයින්ගේ මතය යි. ස්ත්‍රී-පුරුෂ බව තුළ භෞතික වෙනස්කම් ද අර්ථකථනය වීමට විවෘත වන අතර පිරිමින් දෙදෙනෙකු අතර පිරිමියෙකු සහ ගැහැනියක අතර තරම් වෙනස්කම් පැවතිය හැකි ය. එසේ වුව ද මිනිසුන්ගේ සමාජ ජීවිතය සංවිධානය වී ඇත්තේ ද මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව යි. එහි දී ගැහැනු සහ පිරිමින්ගේ භෞතික වෙනස්කම් ද සලකා බැලීමෙන් ගැහැනුන්ට මේ අරහයා සිදුවන අසාධාරණයන් සාධාරණීකරණය කිරීමට හැකි බව ඔවුන්ගේ මතය යි. (Holmes, 2007: 38) සැබවින්ම ගැහැනිය සහ පිරිමියා අතර වෙනසක් පෙනෙන්නේ වෙනස් ඒකාකෘතීන් (stereotypes) iy mrudo¾Yj, (Ideals) බලපෑම් ඔවුන් සමාජයේ පැවතිය යුතු භූමිකාවලට ද ලැබෙන නිසා ය. (Clatterbaugh, 1990: 43)

ඒ අනුව පැහැදිලි වන්නේ ස්ත්‍රී-පුරුෂ බව පවත්නා සමාජ ව්‍යුහය මත නිර්වචනය වී ගොඩනැගෙන බවත් එක් පාර්ශ්වයක ක්‍රියාකාරීත්වයෙන් අනෙක් පාර්ශ්වය පීඩාවට පාත්‍ර කෙරෙන ස්තරායණ මානයක් ලෙස ක්‍රියාත්මක වන බවත් ය. මෙරට ක්‍රියාත්මක වූ දෙවැනි කැරැල්ලට පසුබිම් වූ යුගයේ දී බිහි වූ ගේයපද රචනා පාදක කරගත් මෙම විමර්ශනය සඳහා භාවිත කෙරෙනුයේ ද මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පදනම් කරගත් න්‍යාය යි. දූෂණය, භීෂණය හා බලය අයුතු ලෙස භාවිත සමාජ සන්දර්භයක දී ශ්‍රී ලාංකේය ගැහැනියගේ ආස්ථානය කේන්ද්‍රීය ලෙස විශ්ලේෂණය කළ හැකි වන්නේ එකී න්‍යාය මත පදනම් වීමෙන් පමණි. ඒ අනුව මෙම විමර්ශනයට පාදක වන පවන ගී ප්‍රසංගයේ අන්තර්ගත ගී අතරත ඍජුව ම ගැහැනිය ඉලක්ක කරගත් ගීත ඇත්තේ කිහිපයකි. ඒ ගී සියල්ලම ගුවන්විදුලියෙන් ප්‍රචාරය වීම වාරණය වූ ඒවා ය.

මතු දැක්වෙන ගේයපද රචනාවෙන් ඍජුවම ප්‍රශ්න කර ඇත්තේ පිතෘ මූලික පවුල් ක්‍රමයේ පුරුෂයාගේ පාලනය ස්ථාපිත වී ඇති ආකාරය ගැන යි. එහි දී කාන්තාව කෙරෙහි ක්‍රියාත්මක වන ප්‍රමිතීන් වන කන්‍යාභාවය හෙවත් කුමරි බඹසර, පතිවත යනාදිය හේතුවෙන් ඇය අනාරක්ෂිත බවට පමුණුවා ඇති ආකාරයත් ස්ත්‍රී දූෂණයට ඇය භාජනය වන ආකාරයත් ය.

සීතල පොළොව ම සිරියහනක් වේ වා ගෝනි පඩංගුව මුදු පලසක් වේ වා
ජේලර මහතුන් නෑදැයෝ වේ වා තැටියේ බත්පත දිව බොජුනක් වේ වා

මා මුර ගැවේ පිහිටක් අයදින්ට යි ධන වැද්දකුගෙන් බඹසර රැකගන්ට යි
ඔබ දිව ආයේ මා දිවි ගලවන්ට යි අවි එසවූයේ යුක්තිය විසඳන්ට යි

දිළිඳු ළඳුන්ගේ කුමරි දිවිය උන්ගේ කාසිය උන්ගේ ලොකු ලොකු උන් උන්ගේ
පොලිසිය උන්ගේ කුඩුව අපෙ උන්ගේ නීතිය උන්ගේ හිරබත අපෙ උන්ගේ

තුලාව ගෙන නෙත් යුග බැඳ රෙදි කඩකින් නීතියෙ යුවතිය වැජඹෙයි අද නිදුකින්
ඔබ වන් මිනිසුන් වෙනුවෙන් ඇන සැතකින් මරාදමමි ඇය මරාදමමි සැණෙකින්
(ඔස්ටින් මුණසිංහ/ නන්දා මාලිනී) (ආරියරත්න, 1999:51)

මෙහි දී පවතින සමාජ ක්‍රමය පැහැදිලිවම දෝෂ දර්ශනයට ලක් වී තිබේ. ප්‍රස්තුත තරුණියගේ කන්‍යා භාවය උදුරාගැනීමට තරම් පුරුෂාධිපත්‍යය දැඩි වී ඇති බව මින් විශද වී ඇත. අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීමට කිසිවෙක් නැත. බලය හිමි පන්තිය ඒ වරප්‍රසාද අසාධාරණ ආකාරයෙන් භාවිත කිරීම නිසා බල රහිත නිර්ධන පාන්තිකයින් සූරා කෑමට හසු වී ඇති බවත් එහි කේන්ද්‍රීය බලපෑමට ගැහැනිය ලක් වී ඇති ආකාරයත් ධ්වනිතාර්ථවත් ය. එසේම ඒ හේතුවෙන් හටගත් වෛරය විසින් සාමූහික බැඳීමකින් නිර්ධන පාන්තිකයින් ඒකරාශී කරනු ලැබ ඇති අයුරුත් ඉස්මතු වී ඇත. මෙහි දී විශේෂයෙන් පීඩනයට හා අගතියට පාත්‍රවන ගැහැනියට සිය කන්‍යා භාවය රැක ගැනීමට අවශ්‍ය වන්නේ ද පිතෘ මූලික සමාජයේ පිරිමින් අපේක්ෂා කරන ප්‍රමිතිය උදෙසා එකී ප්‍රතිමාන ක්‍රියාත්මක වන බැවිනි. එසේම ඇගේ ඒ ප්‍රමිතිය බලහත්කාරයෙන් උදුරාගත් ඒ පුරුෂ මූලික සමාජයේ පිරිමියාම එයට එරෙහි වූ පිරිමියා වෙනුවෙන් සිය බලය ක්‍රියාත්මක කර ඇත. මෙහි දී පිරිමින් දෙදෙනකුගේ සමාජ ජීවිතය ද අර්ථකථනය වී ඇති බව පැහැදිලි ය. එරෙහි වූ පුද්ගලයා යනු සම්මුතිගත ප්‍රතිමානවලට විරුද්ධ වූ මතවාදයක් සමාජගත කළ පාර්ශ්වය යි. එහෙත් ඒ පාර්ශ්වයේ මතවාදයට පවතින්නට සාම්ප්‍රදායික පුරුෂ මූලික සමාජය අවකාශ සලසන්නේ නැත. පිරිමියා සහ ගැහැනිය අතර පවතින භෞතික සහ මානසික ස්වභාවයේ වෙනස විශාල කොට විශ්වමය පුරුෂාධිපත්‍යයක් නිර්මාණය කර ඇත්තේ ශිෂ්ටාචාරය මගිනි. (Wilson, 1976: 128) සමාජයේ ක්‍රියාත්මක වන ඇතැම් ප්‍රතිමාන සම්මුතිගත සත්‍ය බවට පත් වී ඇත්තේ මේ අනුව බව මින් පැහැදිලි වේ.

සමාජයේ ක්‍රියාත්මක ප්‍රතිමාන හේතුවෙන් ස්ත්‍රිය පළමුව කන්‍යා භාවය රැක ගතයුතු ය. විවාහයෙන් පසු පතිවත රැක ගත යුතු ය. යට දැක්වෙන්නේ පුරුෂෝත්තම සමාජයෙන් අපේක්ෂිත පතිවත රැක ගැනීමට නො හැකි වී අගතියට පත් ගැහැනියක අවධානයට ලක්කරමින් රචිත ගේයපද රචනාවකි.

අබුඩාබියේ දී ය, දයාබර ස්වාමිනි
කිලිටි වූ ගැහැනියක ලෙස ඔබට ලියන්නෙමි
නොකිලිටි ව ඔබ සැවො ම අහෝ රැකගත නො හැක
මගේ පව් සමා කර මේ ලිපිය කියවන්න

අරාබියෙ මොළේ නැති කාලකණ්ණින් සමඟ
වැතිර හිඳ වෛරයේ ගිනි ගොඩේ පැහෙන්නෙමි
මා සිරුර මගේ නොව අනුන්ගේ යැයි සිතා
ඩිරාමය ඩිරාමය ගණන් කර බලන්නෙමි

මේ අපා දුකට මා පත් කළේ මගෙ රට යි
මගෙ රටේ මහ එකාල යි උන්ගෙ පන්තිය යි
එන්ට හැකි නම් උන්ට කරන දේ දන්නවා
ගමන් බල කරදාසි අරාබියෙ උන් ළඟ යි

උනුන් හට අත නොපා දිවි ගෙවූ ජාතියක්
කානු හෝදන්ට නොරටක යැවූ අය කවුද?
උන්ට හෙන හත වැදී නැසේ වා නැසේ වා
මා ඔබේ ප්‍රියාදර පියවතී ස්වාමිනී
(මර්වින් පෙරේරා/ නන්දා මාලිනී) (ආරියරත්න, 1999: 56)

ගෘහසේවය සඳහා විදේශගතව ලිංගික සූරා කෑමට ලක් වූ ගැහැනියකගේ දෝෂාරෝපණයක ආකාරයෙන් මෙය රචිත ය. මෙරට ජනයාට සැහීමකට පත් විය හැකි ආර්ථික සුරක්ෂිතතාවක් රට අභ්‍යන්තරයෙන් උත්පාදනය නොවීම හේතුවෙන් රටෙහි කාන්තාවනට පවා විදේශගත වීමට සිදු වී ඇත. එහි දී ඔවුන් ශ්‍රම සූරා කෑමට හා ලිංගික අපයෝජනයට ලක් වන ආකාරය කියා පෑම රචකයාගේ අපේක්ෂාව යි. සමස්තයක් ලෙස බලන කල පහළ පාන්තිකයන් අත්විඳින දුක්ඛිත ජීවිතයත් ඔවුනට සිදු වී ඇති අසාධාරණයත් විවිධ දෘෂ්ටිකෝණවලින් හෙළි කර ඇත. කායික ශ්‍රමිකාවක වූ ඇය ලිංගික ශ්‍රමිකාවක බවට පත් වී ඇති බව මෙහිලා ඉස්මතු ව පෙනෙන තවත් කරුණකි. එනම්, පුරුෂ මූලික සමාජය තුළ කාන්තාව පුරුෂයන් විසින් කෙළි බඩු ලෙස භාවිත කරනු ලැබීමකි. බලය හිමි පංතියට විරුද්ධ ව නැගී සිටීමට ඇගේ සැමියාට හෝ ඇයට නො හැකි ය. පුරුෂ මූලික සමාජයට විරුද්ධ වීමට මෙබඳු බලය අහිමි පාන්තිකයින්ට නො හැකිය. සමාජයේ සියලු කටයුතු තීරණය වී ඇත්තේ බලය ධනය හා නිලය කේන්ද්‍ර කර ගනිමිනි. උක්ත ගැහැනියට සිය පවුලේ අනාගතය වෙනුවෙන් ස්වකීය පෞද්ගලිකත්වය පවා විනාශ කර ගැනීමට සිදු වී ඇත. එවක ස්ථාපිත පාලන තන්ත්‍රය මගින් ගැහැනිය ලිංගික සූරා කෑමට හා අවභාවිතයට ලක් කර ඇති අයුරු ප්‍රතීයමාන කිරීම මෙහි අභිප්‍රාය යි. කවර සමාජයක වුව ගැහැනිය නිර්වචනය වී ඇත්තේ කාමජනක සත්වයෙකු ලෙස වුවත් ඇය මෙසේ අවභාවිතයට ලක් කිරීමට අනියමාකාරයෙන් රාජ්‍ය යන්ත්‍රණය ද හේතු වී ඇති බව මෙහි පැහැදිලි ය.

මාතෘ-දාරක බන්ධනය පවා සමාජ පීඩනය හේතුවෙන් විනාශ වී ඇති ආකාරය මතු දැක්වෙන ගේයපද රචනාවෙන් විශද වේ.

දස මසක් මා කුස තුළ උන් පුතුනේ දැන් ඉතින් අප වෙන් විය යුතු වේ
වීසි කරමි වන ළැහැබට දෑස පියාගෙන
නයි පොළඟුන්ගෙන් මවක ලබා වා වග වලසුන්ගෙන් පියකු ලබා වා

දැඩි වී වග වලසුන් අතරේ වලසකු වී අවුදින්
වීසි කරන්නට දරුවන් තනනා ලෝකය කා වනසන් පුතුනේ

සැතපී නයි පොළඟුන් දරණේ පොළඟකු වී අවුදින්
අහක දමන්නට දරුවන් වදනා ලෝකය කා වනසන් පුතුනේ
(ගුණදාස කපුගේ/ නන්දා මාලිනි) (ආරියරත්න, 1999: 63)

මෙය ද ගැහැනිය අවභාවිතයට ලක් වීමක් ගැන කරන හෙළිදරව්වකි. කිසි යම් හේතුවක් මත ප්‍රස්තුත තරුණියට සිය කුස දැරූ දරුවා ජීවත් කරවීමට නොහැකි වී ඇත. ඒ, ආර්ථික ගැටලුවක් හෝ ලිංගික අපයෝජනයකට ලක් වීමක් නිසා විය හැකි ය. ඇය ලිංගික බලහත්කාරකමකට හෝ රැවටීමකට හෝ ලක් වී ඇති නම් ඒ, ස්ත්‍රී- පුරුෂ ස්තරායණය ක්‍රියාත්මක වීමකි. 1886 සිට පැවත එන දණ්ඩ නීති සංග්‍රහයේ 303 සිට 307 දක්වා වගන්තිවලින් ගබ්සාවට අදාළ නීති සහ දඬුවම් දක්වා ඇත. එහි 306 වැනි වගන්තියට අනුව දරුවකු ඉපදීමට පෙර ඒ දරුවා පණ ඇතිව ඉපදීම වැළැක්වීමේ හෝ එම දරුවා ඉපදීමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ මරණය සිදු කිරීමේ අදහසින් යමකු යම් ක්‍රියාවක් කරනු ලැබූ, එකී ක්‍රියාව පණ ඇතිව දරුවාගේ ඉපදීම වළක්වතොත් හෝ දරුවා ඉපදීමෙන් පසු ඔහුගේ මරණය සිදුකරතොත් බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ හැකි ය. (දණ්ඩ නීති සංග්‍රහය, 1999: 92) ඒ අනුව පැහැදිලි වන්නේ කාන්තාවට කුමන තත්ත්වයක දී වුව අකැමැත්තෙන් හෝ දරු ගැබ දැරීමට සිදු වී ඇති බව ය. ලංකාවේ ගබ්සාව අපරාධ නීතී අතරට ගොනු කර ඇත්තේ රාජ්‍යයට එරෙහි ව කෙරෙන අපරාධයක් ලෙස ය. එය පැවැතෙන්නේ යටත්විජිතවාදයෙන් ලද දායාදයක් ලෙසිනි. වර්තමානයේ මෙරට භාවිත කරන ගබ්සා නීතිය 1860 දී ඉන්දියානු ගබ්සා නීති ආකෘතියට අනුව සාදන ලද 'ජීවිතයට ඇති අයිතිය' (Rights to Life) යන දෘෂ්ටිය මුල් කරගෙන බිහි වූවකි. යට දැක් වූ ගේයපද රචනයෙන් කියැවෙන ගැහැනියට සිය දරුවා අකැමැත්තෙන් හෝ බිහිකිරීමට සිදු වී ඇත්තේ මෙරට නීති ප්‍රකාර ව ජීවත් වීමට සිදුවන නිසා ය. එහෙත් මවකගේ භූමිකා ප්‍රකාර ව ඒ දරුවා ජීවත් කරවීමේ යුතුකම ඇය ප්‍රතික්ෂේප කර ඇත්තේ දරුවා අතහැර දැමීමෙනි. ඇගේ වෛරය හා කෝපය කේන්ද්‍රීයව යොමු වී ඇත්තේ වීසි කරන්නට දරුවන් තනනා හා අහක දමන්නට දරුවන් වදනා ලෝකය වෙත ය. මෙහි වගකීම ස්ත්‍රිය වෙතට පැවරීම උක්ත ගේයපද රචනාවෙන් රචකයා ප්‍රතික්ෂේප කර ඇත. ඉන් විද්‍යමාන වන්නේ පවතින පාලන තන්ත්‍රයට අවනත වීමට සිදු වූ ගැහැනිය වෙත පළ කෙරුණු දයාපරවශ දෘෂ්ටියයි. එහෙත් සමාජය මෙබඳු කරුණුවල දී සියලු වරද පවරන්නේ ගැහැනියට පමණයි. ගැබක් හටගන්නේ පැහැදිලි පාර්ශ්ව දෙකක සම්බන්ධතාවෙනි. ''එහෙත් ගැබ පිළිබඳ පූර්ණ වගකීම එක් පාර්ශ්වයකට පමණක් දීමේ දී සදාචාරයේ පුරුෂ කේන්ද්‍රීය ස්වභාවය මතු වේ. එනම්, මෙයට සම්බන්ධ අනෙක් පාර්ශ්වය පැහැදිලි ව ම වගකීමෙන් නිදහස් කොට ඇත. තව ද ගබ්සාව පිළිබඳ නීති සැකසීම හෝ අදහස් ප්‍රකාශ කිරීමේ දී ද පුරුෂයන් (තීරණ ගන්නවුන්) මේ ප්‍රශ්නයේ දී බාහිරව සිටිමින් යුක්තිය ධර්මිෂ්ඨභාවය යනු මූලික අදහසින් බලමින් තමන්, අනිත් පුද්ගලයින්ගෙන් වෙනස් කොටසක් සේ දකිති. සදාචාරය රැකීමට පංගුකාරයෙන් ලෙස ඔවුන්ගේ වගකීම ඔවුන් දකින්නේ බැහැර සිට ය. එනම්, සදාචාරය රැකීමේ කොටස්කාරීත්වය ඇත්තේ ඔවුන් ද එහි මූලික පංගුකාරයන් ලෙස සිතා නොව, තමන් වෙනස් කොටසක් සේ සිතා ගෙන යි. උදාහරණ වශයෙන් කාන්තාව විසින් සංස්කෘතිය රැකගත යුතුයි යන අදහසත්, අසංවරවීම කාන්තාවන්ට පමණක් ආදේශ කර සිතීමත් දැක්විය හැකි ය. පුරුෂයින්ගේ සදාචාරීය වගකීම ලෙස ඔවුන් දකින්නේ සදාචාරය ආරක්ෂා කිරීම යි.'' (පීරිස්, 1999: 100-101)

එවක ජනතා විමුක්ති පෙරමුණ මුල් කරගනිමින් මෙරට ක්‍රියාත්මක වූ කැරැල්ලේ දී අත් අඩංගුවට පත් වූ තරුණයනට අත් වූ ඛේදජනක ඉරණම මතු දැක්වෙන ගේයපද රචනාවෙන් පැහැදිලි කර ඇත. එදා පොදුවේ මුළු සමාජය ම මුහුණපා ඇති ගැටලු විස්තර කිරීම සඳහා ගේයපද රචකයා පුරාණෝක්ති ද ඉවහල් කරගනී. ''ජවිපෙ දෙවැනි කැරැල්ල අවසාන වන විට ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු වූ මුළු පාසල් සිසුන්ගේ සංඛ්‍යාව 2327 කි. වසර 1989 දෙසැම්බර් 01 වන විට ඇඹිලිපිටිය ප්‍රදේශයේ පාසල් 13න් පැහැරගත් සිසු පිරිස පමණක් 53ක් විය. ඉන් 48 දෙනකු කුරිරු වධ බන්ධනවලින් පසු ජීවිතක්ෂයට පත්විය... 1986 සිට 1990 කාලයේ දී ඝාතනයට ලක් වූ විශ්වවිද්‍යාල සිසුන්ගේ ගණන 623කි. ඉන් සිසුන් 396 දෙනකු හඳුනාගැනුණු අතර සෙසු 227 දෙනා අයත් වන්නේ අතුරුදහන් වූවන්ගේ ලේඛනයට ය.''

(වික්‍රමරත්න, 2017: 453-468) පහත දැක්වෙන ගේයපද රචනයට පාදක වී ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ මරණය යි. එහෙත් ඉන් ධ්වනිත කරනුයේ කැරැලි සමයේ අමානුෂික වධ වේදනා ලැබ ඝාතනය වූ තරුණ ප්‍රජාව යි. මෙය නම් කර ඇත්තේ 'දෙව් මවු වලප' යනුවෙනි.

මියෙන්න පුතුනේ මියෙන්න වධ විඳ හෙළන්න පුතුනේ හෙළන්න ලේ කඳ
කකියන දඬු කුරුසේ වාවාගන්නම් මගෙ හද ඉකි බිඳ මිරිකා කඳුළු ඇසේ

කථනය - (ඔවුන් මගේ පුත්‍රයාට කටු ඔටුනු පලන්දා කස පහර දී, මූණට කෙළ ගසා කුරුස ගසේ තබලා ඇණ ගසලා)

ගලවා සළුපිළි අධර්මයේ ගලවා අබරණ අයුක්තියේ
පෙන්වූයේ පුත නුඹ ම යැ නිරුවත පාලක ඝාතක ජඩයන්ගේ
පාහර පූජක ගවයන්ගේ

කථනය - (ඔහු කළ මහා පාප කර්මය එය යි. අධර්මයේ නිරුවත අයුක්තියේ නිරුවත පෙන්වාදීම යි)

ඉපදී පොඩි ගව මඩුවේ හැදී වැඩී වඩු මඩුවේ මාළිග මන්දිර මණ්ඩප පුපුරා
නැඟු කෙසර හඬ අයෝමය යි පුතුනේ අභීත මැ යි පුතුනේ

කථනය - (මං දුක් වෙන්නේ නැහැ පුතේ උඹ ගැන)

සෙබළුනි මන්ද විරාමය හෙල්ලට අනිවු අනිවු මගෙ පුතුගේ ඇළයට
සෙලවෙන්නේ පුතු සිරුරේ ලේ පමණ යි
සැඟවෙන්නේ මා පුතු පණ නල පමණ යි

කථනය - (කිසාගෝතමිය සිද්ධාර්ථට කියූ නිබ්බුත පද ම යි පුතේ මේ අහිංසක මරියා කුරුස ගහ යට අඬ අඬා කියන්නේ)

නිබ්බුතා නූන සා මාතා නිබ්බුතා නූන සෝ පිතා
නිබ්බුතා නූන සා නාරී යස්සායං ඊදිසෝ පති
(ස්ටැන්ලි පීරිස්/ නන්දා මාලිනී) (ආරියරත්න, 1999: 66-67)

ව්‍යංග්‍යාර්ථය කැටි වූ මේ ගේයපද රචනයෙන් දාරක ශෝකයෙන් මුසපත් වූ මවුවරුන් සිහිපත් කරවා ඇත. දෙව් මවගේ දෘෂ්ටිකෝණයෙන් පද රචනය විකාශනය කිරීමෙන් දාරක වියෝගයෙන් නැඟෙන ශෝකයට ගෞරවාර්හ සහ පූජනීය හැඟීමක් එක් කර ඇත. දෙව් මව විසින් එදා නියෝජනය කළ භූමිකාව වර්තමානයේ අරගලයට දායක වූ දරුවන්ගේ මවුවරුන් විසින් නියෝජනය කරනු ලබන බව ධ්වනිත කිරීම රචකයාගේ අරමුණ යි. ඔහු ක්‍රිස්තු පුරාණෝක්තිය සම්බන්ධ කර ඇත්තේ ඒ නිසා ය. ආගම් දෙකක අන්තර්ගත ලක්ෂණ සංකලනය කිරීමෙන් සිද්ධාර්ථ කුමාරයා මෙන් ම ජේසුස් වහන්සේ ද විමුක්තිය උදෙසා කළ අරගලය මූර්තිමත් කර ඇත. වර්තමානයේ මිය යන මේ දරුවන් ද කැප වී ඇත්තේ එබඳු අරගලයකට බව ඉස්මතු කිරීමෙන් ඒ දරුවනට සුවිශේෂත්වයක් ලබාදී අරගලයට පොදු සමාජ අනුමැතිය ලබාගැනීමට උත්සාහ දරා ඇත. එහෙත් මින් ව්‍යංග්‍යාර්ථවත් කෙරෙන තවත් යථාර්ථයකි. එනම් මවකගේ කාර්යභාරය යි. ගැහැනිය විවාහ වීමත් සමඟම ඇගේ සැමියාගේ සමූහයට ඇය අයත් වේ. ඔහුගේ පරම්පරාව පවත්වාගෙන යාමට දරුවන් ජනනය කිරීමේ කාර්යයට පමණක් ඇය සම්බන්ධ වේ. මේ අනුව ගැහැනිය පිතෘ මූලික ක්‍රමයෙහි දේපොළට අයිතියක් නොමැති වීම හා පරම්පරාව ගෙනයාමට එතරම් ඉවහල් නො වන හෙයින් බලපෑම් කළහැකි කොටසට අයත් වන්නේ නැත. එහෙත් ඕනෑම සමාජයක පවුල් ක්‍රමයකින් අපේක්ෂා කරන කාර්යයන් කිහිපයකි. ඒ අතර දරුවන් සමාජානුයෝජනය කිරීම, ප්‍රජනනය හා ආරක්ෂාව ප්‍රධාන වේ. එමෙන් ම සංකීර්ණ වූ සමාජයේ දී රැකියාවේ නියුක්ත වෙමින් පුරුෂයාට හා සමාන කාර්යභාරයක් ඉටු කිරීමට ඇයට සිදුවිය. (මනුරත්න, 2004:91) තව ද විවාහයෙන් පසු ව සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයෙහි ගැහැනියට තමන්ගේ දරුවන්ගේ, සැමියාගේ හා ඔහුගේ ඥාතීන්ගේ කටයුතු කිරීමට සිදු වේ. ඇයගේ සමස්ත ජීවිතයම ගත වන්නේ මෙකී ගෘහ කටයුතුවලට සීමාවීමෙනි. මෙසේ ගැහැනිය පවුල තුළ සිදුකරන ගෘහ කටයුතු සැලකෙන්නේ ඒකාකාරී හා ප්‍රතිලාභ නො ලබන ශ්‍රමය ලෙස යි. මෙසේ ඇය සමස්ත ජීවිතයම දරුවන් ප්‍රමුඛ කොටගත් පවුල වෙත කැප කර ඇති අතර ඇයට අහිමි කරවා ඇත්තේ ඇගේ එකී සමස්ත ජීවිතයම බව උක්ත ගේයපද රචනාවෙන් විශද කෙරෙන සත්‍යය යි. ඇය මුළු ජීවිත කාලයක් පුරා කැප කරමින් කළ අයෝජනය උදුරා ගන්නේ සදාචාරීය වගකීම ආරක්ෂා කිරීමට නීති සම්පාදනය කරන පුරුෂ සමාජය යි. මෙය ගැහැනියගේ සමස්ත

කාර්යභාරයම නො සලකා හැරීමකි. එය ඉතිහාසය පුරාම අඛණ්ඩව සිදුවන බව රචකයා ක්‍රිස්තු පුරාණෝක්තිය සමඟින් තත් යුගයේ මව සමපාත කරමින් පවසා ඇත.

තත් යුගයේ සිදු වූ මේ ඛේදවාචකයම වෙනස් ප්‍රවේශයකින් රචකයා ඉදිරිපත් කර ඇත්තේ මෙසේ ය.

යදමින් බැඳ විලංගු ලා මගේ පුතා රැගෙන යන්
ඉදිකටු ඇන ඇඟිලි තළා දෙතිස් වධය පමුණුවන්
අලුත් ලොවක් ගැන සිතීම දඬුවම් දෙන වරද නම්
කුමට එරට අධිකරණය නීතිය සහ විනිසුරන්

කකා බිබී නටන අතර නරුම යහළු යෙහෙළියන්
පන්දු කෙළින අතර ඉහළ පාසල්වල අමනයන්
රට ගිනි ගෙන ඇති වග දුටු මගේ එක ම පුතණුවන්
එගිනි නිවන මඟ සෙවීම වරදක් දැයි මට කියන්

ගිනි ගන්නා රටක කෙළින මීහරකුන් වැනි පුතුන්
කුමට ද මට මහ විරුවෙකි සිරගෙයි මළ මගෙ පුතුන්
කෝටි ගණන් බිහි වේ වා මගෙ පුතු වැනි තව පුතුන්
කිරිමවු ලෙස මම ඉන්නම් එවන් පුතුන් ළඟ උතුම්
(සරත් දසනායක/ නන්දා මාලිනී) (ආරියරත්න, 1999: 54)

'එජාප ආණ්ඩුව ගෙන ආ අධ්‍යාපන ධවල පත්‍රිකාව මඟින් අධ්‍යාපන කප්පාදු කිරීම් රැසක් යෝජනා කර තිබුණි. මේ නිසා සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීමට වැට කඩුලු බැඳීමක් විය. අධ්‍යාපන ධවල පත්‍රිකාවට විරුද්ධ ව සරසවි සහ පාසල් සිසුන් දහස් ගණනක සහභාගීත්වයෙන් 1982 ජනවාරි 20 ගාලු මෝදර ඉදිරිපිට ප්‍රබල උද්ඝෝෂණයෙන් අනතුරුව එවකට තිබූ පාර්ලිමේන්තු භූමිය වටකරන ලදි. ධවල පත්‍රිකාව ඉදිරිපත් කිරීම එම මොහොතේ සිදු නො වුව ද 1983 ජුලි කලබලවලින් පසු ජවිපෙ පක්ෂ තහනමත් සමඟ ම උපක්‍රමික වශයෙන් ධවල පත්‍රිකාව කොටස් වශයෙන් ක්‍රියාවට නැගීමට ආණ්ඩුව සමත් විය.' (වික්‍රමරත්න, 2017: 435) මෙසේ පැවති පාලන තන්ත්‍රය විසින් සිදු කරනු ලැබූ නිදහස් අධ්‍යාපන කප්පාදුවට එරෙහිව එක් වූ සමස්ත ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ප්‍රජාව ගෞරවයට ලක් කිරීම ඉහත ගේයපද රචනයේ අරමුණ යි. රචකයා මවකගේ දෘෂ්ටිකෝණයෙන් යුතු ව විමර්ශනය කර ඇත්තේ එදවස පැවති දූෂිත සමාජ ක්‍රමය යි; දහස් සංඛ්‍යාත දරුවන් මරා දැමීමට පෙලඹුණු පාලන තන්ත්‍රය යි. මෙහි දී ද උද්දීපනය කර ඇත්තේ මව්වත් සෙනෙහස යි. පවත්නා අනීතික අයුක්ති සහගත සමාජ ක්‍රමයට එරෙහි වූ සිය දරුවා අහිමි වීමේ ඛේදවාචකයට මේ මවට මුහුණ දීමට සිදු වී ඇත. පොදු සමාජයේ තීරණ ගැනීමේ අධිකාරී බලය පුරුෂයාට හිමි වී තිබීම හේතුවෙන් මවකගේ කාර්යභාරය නො සලකා හැරීමට ලක් වී තිබෙන අයුරු මෙහි දී ද ධ්වනිතාර්ථවත් ය. අප්‍රමාණ කැප කිරීම් කරමින් ජීවිතය ලබා දුන් දරුවා මරණයෙන් ගලවා ගැනීමට හඬක් නැගීමේ අයිතිය මේ ගැහැනුන්ට අහිමි ය. පුරුෂ සමාජයේ සදාචාරය ආරක්ෂා කරන නීතිය මව්වරුන්ගේ හඬට කන්දීමට සූදානම් නැත. ඒ බව මේ මව පවසන්නේ 'කුමට මෙරට අධිකරණය නීතිය සහ විනිසුරන්' යනුවෙන් විමසමිනි. එබඳු අනීතික ඊනියා සදාචාරසම්පන්න සමාජයට එරෙහි ව සටන් වැද මිය ගිය සිය පුතු විරුවෙකු ලෙස සලකන්නට මේ මව පෙළඹී ඇත්තේ ඒ නිසා ය. එ පමණක් ද නො ව ඇය එබඳු දූවා දරුවන් වෙනුවෙන් කිරි මවක ලෙස සිටින්නට සූදානම් බව ද පවසන්නී ය. මේ වනාහි සැබෑ ලෙස ම ගැහැනිය ගතානුගතික අනීතික සමාජයට විරුද්ධ ව නැගී සිටීමකි. එනම්, ස්ත්‍රී-පුරුෂ ස්තරායණයට එරෙහි ව හඬ නැගීමකි. බලය, තීරණ ගැනීම, ආධිපත්‍යය, වරප්‍රසාද හා සූරා කෑම ආදි සියල්ල ඉහළ ස්තරය වූ පුරුෂ සමාජය සතුව පවතින අතර පීඩනයට ලක්වීම, අවම වරප්‍රසාද, සූරා කෑමට ලක්වීම, අඩු සම්පත් හිමි ව ඇත්තේ පහළ ස්තරය වූ ගැහැනුන්ට ය. මේ මව අභියෝග කරනුයේ එකී සියලු වරදාන, වරප්‍රසාද හා ආධිපත්‍යය හිමි පුරුෂ සමාජයට ය.

## නිගමනය

80 දශකයේ දැකිය හැකි වූ විරෝධාකල්ප ගීවලින් නිරූපිත ගැහැනිය පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පදනම් කරගනිමින් කරන ලද මේ විමර්ශනය සඳහා පාදක කරගත්තේ 'පවන' ගී ප්‍රසංගයට භාවිත ගී පහකි. එකී ගී මගින් එවක පැවති පීඩනකාරී සමාජයේ ගැහැනිය අවභාවිතයට පත් වූ ආකාරය විශද වී ඇත. එහි දී පුරුෂ පාර්ශ්වයේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් කාන්තා පාර්ශ්වය පීඩාවට පාත්‍ර කෙරෙන ස්තරායණ මානයක් බවට පත්වීමට පැවති පාලන තන්ත්‍රය ද හේතු වී ඇති බව පැහැදිලි වේ. පොදුවේ පුරුෂ සමාජය අපේක්ෂා කරන කාන්තාවගේ පාරිශුද්ධත්වය කෙළෙසීමට පෙලඹෙන්නේ ද ඒ පුරුෂ සමාජයේ ආධිපත්‍යධාරී පුරුෂ මානසිකත්වයම ය. එහි දී ඊට එරෙහි වන පිරිමින්ට විරුද්ධ වීමට තරම් තත් සමාජයේ නීතිය, බලයට හා ධනයට යට වී ඇත. එසේ ම නිර්ධන පාන්තික කාන්තාවට මේ තත්ත්වය ඉතාමත් අහිතකර ලෙස බලපා ඇති බව ද පැහැදිලි වේ. විධිමත්

ආර්ථික නියාමනයක් නැති රටක මුදල් ඉපයීම සඳහා විදේශගත වීමට ගැහැනුන්ට සිදුවීමත් එහි දී ඇය ලිංගික සූරාකෑමට ලක් ව ඇති ආකාරයත් දැකිය හැකි අනෙක් කරුණු යි. ගබ්සාව තහනම් වූ රටක නීති ප්‍රකාරව අකැමැත්තෙන් හෝ දරුවන් බිහි කිරීමට සිදු වූ මවකගේ විරෝධයත් පවතින පාලන ක්‍රමයට විරුද්ධ ව සිය දරුවන් මරාදැමීම ගැන මව්වරුන්ගේ විරෝධයත් මේ ගීතාවලියෙන් ධ්වනිත වී ඇත. මෙහි දී අවධානයට පාත්‍ර වී ඇත්තේ කාන්තාව පීඩනයට පත් කරන පිරිමින් පමණක් නො වේ. එසේ කිරීම සඳහා නීති සම්පාදනය කරන, ආධිපත්‍ය දරන, තීන්දු තීරණ ගන්නා පිරිමින්ගෙන් ගහණ සමස්ත පාලන තන්ත්‍රයම වීම සුවිශේෂත්වයකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ගැන සාකච්ඡා කිරීමේ දී බොහෝ විට අවධානයට පාත්‍ර වන්නේ පවුල් සංස්ථාව වුවද මෙකී ගීතාවලියෙන් අවධානය යොමු කර ඇත්තේ ඊට ඉහළින් පවතින සමාජ හා දේශපාලනික ව්‍යුහය වෙතට යි. එකී ව්‍යුහයේ බලපෑම හේතුවෙන් අප්‍රධාන තත්ත්වයට පත් ව ඇති ගැහැනියට අත්විඳින්නට සිදු වී ඇති පීඩනය යි. තව ද දීර්ඝ කාලයක් තිස්සේ පරපුරෙන් පරපුරට පැවත ආ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ වූ සාම්ප්‍රදායික ආකල්පවලට දක්වන විරෝධය, ගැහැනියගේ ප්‍රබල හඬ ඇගේ ආස්ථානය ස්ථාවර ව ස්ථාපිත කිරීමට මෙකී ගීතාවලියෙන් උත්සාහ දරා තිබීම වැදගත් ලක්ෂණයකි. ඒ අනුව මෙම විමර්ශනයෙන් පැහැදිලි වන්නේ රටක ව්‍යුහාත්මක හා ප්‍රතිපත්තිමය කරුණු ගැහැනිය අප්‍රධාන තත්ත්වයට පත් කිරීමට හේතු වී ඇති ආකාරය යි. එහි දී අවභාවිතයට පැමිණවීමට විරෝධය පළ කිරීමට හා ඊට එරෙහි ව තීරණ ගැනීමට හා හඬ නැගීමට ගැහැනිය දිරි ගන්වා ඇති ආකාරය යි. ඒ අනුව මෙකී විරෝධකල්ප ගීයෙන් ප්‍රතීයමාන කර ඇත්තේ අයුක්තියට, අසාධාරණයට, අවනීතියට එරෙහි ව කටයුතු කිරීම ශ්‍රී ලාංකේය ගැහැනියගේ ආස්ථානය විය යුතු බව යි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ආරියරත්න, සුනිල් තුටු පඬුරු (2010), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

තෙන්නකෝන්, රජිත්, වාරණ පුරාණය, (2003) සමන් ප්‍රකාශකයෝ, නුගේගොඩ

මනුරත්න, එම්. ජී., ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා පවුල (2004) ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

වික්‍රමරත්න, ධර්මන්, ජව්පෙ 2වැනි කැරැල්ල (2017) කර්තෘ ප්‍රකාශන

පීරිස්, ටිලන්ති, 'ගබ්සාව පිළිබඳ යථාර්ථවාදී කතිකාවකට පිවිසුමක්', නිවේදනී, සංස්. තරංගා ද සිල්වා, 1999 කාන්තා අධ්‍යාපන සහ පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ 06

දණ්ඩ නීති සංග්‍රහය, 15 වෙනි අධිකාරය, (1999). රාජ්‍ය ප්‍රකාශන කාර්යාංශය, කොළඹ

Clatterbaugh, Kenneth, Contemporary Perspective on Masculinity (1990) Westview Press, Francisco

Connell, Raewyn, Gender (2009) Polity Press, UK

Holmes, Mary, What is Gender- Sociological Approach (2007) Sage Publication Ltd., UK

Wilson Edward, On human Nature (1976) Harvard University press, Cambridge

Nature Culture and gender, Ed. Carol MacCormack and Marilyn Strathern (1980) Cambridge press, Cambridge

^ http://archives.dinamina.lk/2010/08/27/_art.asp?fn=f1008272&p=1&

^http://www.divaina.com/2010/09/03/cineart03.html&